
# රජරට වකුගඩු රෝගයේ ව්‍යාප්ති සිතියම සමග දෙමළ නිජබිම් සිතියම පැහුණේ අහම්බයකින් ද?




රජරට යනුවෙන් අද හඳුන්වන ප්‍රදේශය කුමක් දැයි අප අතර එකඟතාවක් ඇතැයි බලාපොරොත්තු විය නොහැකි ය. ඇතැමුනට අනුව එය වත්මන් පළාත්, දිස්ත්‍රික්ක නිර\ණයේ උතුරුමැද පළාතයි. එනම් අනුරාධපුර සහ පොළොන්නරු දිස්ත්‍රික්කයි. තවත් සමහරුන්ට අනුව රජරට යනු නුවර කලාවිය යනුවෙන් හඳුන්වන ප්‍රදේශයයි. නුවර කලාවිය යනු නුවර වැව, කලා වැව සහ පදවිය වැවෙන් පෝෂණය ලබන ප්‍රදේශයයි.

එසේ වුවත් රජරටට එම නම ලැබෙන්නට ඇත්තේ රට කරවූ රජුන් ජීවත් වූ ප්‍රදේශය යන අරුතින් විය හැකි ය. මෙහි දී රට යනුවෙන් හැඳින්වූයේ රජරට පමණක් නො වේ. රුහුණු රටත්, මායා රටත් ඊට අයත් විය. බොහෝ විට රජු ගේ සහෝදර ඈපා සහ මාපාවරු රජු අණින් රුහුණු රට සහ මායා රට කෙරවූ හ. එනම් මහරජ, රජරට සිට රට කරවී ය. රට කෙරවූ රට රජරටක් වූයේ වසරක් දෙකක් නො වේ. වසර එක් දහස් පන් සියයක් පමණ (ක්‍රි. පූ. 400 සිට ක්‍රිව 1200 දක්වා) එය රජරටක් විය. ඉන් පළමු වසර 1400 අනුරාධපුරයත්, ඉතිරි වසර 200 පොළොන්නරුවත් රජරටේ මෙන් ම මුළු රටේ ම අගනගරය විය. දැදුරුඔයේ සිට මහවැලි ගඟ දක්වා වූ භූමි ප්‍රදේශය එකල රජරට ලෙස හැඳින්වූ බව පැවසේ.

පසුකාලීනව සටකපට ලෙස රටේ පාලන බලය ලබාගත් බටහිරයෝ අපේ පරිපාලන ව්‍යුහය, පරිපාලන ඒකක නො සලකා හැර කිසිදු ඓතිහාසික හෝ භූගෝලීය පදනමකින් තොරව හුදු ඔවුන් ගේ බලය රැකගැනීම පමණක් අරමුණු කොට නව පළාත් බෙදීම් හඳුන්වා දුන් හ. පසුගිය වසර තුන් හාර සියය තුළ මේ ආකාරයේ පළාත් බෙදීම් විස්සක් තිහක් පමණ හඳුන්වා දීමට සිදුවීමෙන් ම ඒවායේ ඇති අසාර\ථකත්වය පිළිබිඹු වේ. මෙ කවර පළාත් බෙදීමක් හමුවේ වුව ද රජරට යනුවෙන් පැවසූ විට අදටත් අපට සිහි වන්නේ අනුරාධපුර -පොළොන්නරුව මිස ශ්‍රී ජයවර\ධනපුර පාර\ලිමේන්තුව පිහිටි ප්‍රදේශය හෝ කොළඹ නගරය නො වේ.

රජරට ගැන මේ තරම් කතා කරන්නට සිදු වුයේ අද මේ විශේෂාංගය තුළින් එළිදකින අදහසට එය එතරම් ම වැදගත් බැවිනි. පසුගිය වසර 10ක පමණ කාලය තුළ අසන්නට ලැබුණු දෙයක් නම් රජරට ප්‍රදේශයෙන් විශාල වකුගඩු රෝගීන් සංඛ්‍යාවක් හමු වු බවයි. වසරින් වසර එම රෝගීන් සංඛ්‍යාව ඉහළ යන බව ද පැවසේ. මෙම රෝග තත්ත්වය වකුගඩු රෝගය ලෙස හඳුන්වන්නේ බටහිර වෛදය විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙනි. මෙකී රෝග තත්ත්වයෙන් පෙළෙන රෝගීන් ගේ වකුගඩුවලින් ලබාගත් පටක සාම්පල පරීකෂාවෙන් පෙනී ගොස් ඇති කරුණක් නම් එසේ පරීකෂාවට ලක් කළ පටක අතුරින් 80%කටත් වඩා වැඩි කොටසක වෘක්ක සෛල ආශ්‍රිතව අසාමාන්‍යතාවක් වර\ධනය වී ඇති බව ය. (Tubulointestitial Disease) සාමාන්‍යයෙන් බටහිර වෛද්‍ය විද්‍යාවේ රෝග තත්ත්වයක් විස්තර කරන විට ඒ සඳහා හේතු වන කරුණ (Actionology)- ද පැහැදිලි කෙරෙ\. අවාසනාවකට රජරට වකුගඩු රෝගය ලෙස හඳුන්වන මේ රෝග තත්ත්වය උදෙසා එවැනි සාර\ථක පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීමට බටහිර වෛද්‍ය විද්‍යාවට හැකි වී නැත. එහෙයින් අදටත් මේ රෝග තත්ත්වය සොයාගත නොහැකි වු හේතුවකින් (Unknown/uncertain actionology)- ඇති වන්නක් ලෙස විස්තර කෙරෙ\.

කෙසේ වෙතත් මෙවැනි රෝග තත්ත්වයක් හට ගැනීමට හේතුපාදක විය හැකි හේතු කාරණා කිහිපයක් මේ වන විට ඉදිරිපත් ව ඇත. ඉන් ප්‍රධාන අදහසක් වන්නේ රජරට ප්‍රදේශයේ ජලයේ ඉහළ ෆ්ලෝරයිඩ් සාන්ද්‍රණය රෝගයට හේතුව විය හැකි බවයි. ඊළට අදහස වන්නේ තත්ත්වයෙන් බාල ඇලුමිනියම් භාජන භාවිතයෙන් ඇලුමිනියම් අයන ෆ්ලෝරයිඩ් සමඟ එක් ව විෂ සංයෝග නිපැදවී ඒවා වකුගඩු සෛල මත ක්‍රියා කර රෝග තත්ත්වය ඇති කරන බවයි. ඉදිරිපත් ව ඇති තවත් අදහසක් වන්නේ ප්‍රදේශයේ කෘෂිකාර\මික කටයුතු සඳහා බහුල ලෙස යොදා ගන්නා කෘෂි රසායන රෝගය ඇති වීමට හේතුව බවයි. ඊට අමතරව රසායනික පොහොර, කෘමිනාශක, වල්නාශකවල අඩංගු කැඩ්මියම් වැනි බැර ලෝහ ආහාර දාම ඔස්සේ ගමන් කර ඉහළ අනුපාතවලින් මිනිස් සිරුරට ඇතුළු වී රෝගය ඇති කරවන බවට අදහසක් ද ඉදිරිපත් ව ඇත. මේ ප්‍රදේශයේ ජනතාව අධික ලෙස මත්පැන් භාවිත කරන බවත්, නීති විරෝධී ලෙස නිපදවන තත්ත්වයෙන් බාල මත්පැන් රෝගයට හේතුව විය හැකි බවටත් වු අදහසක් ද ඇත. 2007 නොවැම්බර\ 21 දින විදුසර අපේ පිටුවට ලිපියක් සැපයු මහත්මයකු පවසා තිබුණේ තත්ත්වයෙන් බාල උණුවතුර බෝතල් භාවිතය ද රෝගයට හටගැනීමට හේතුවක් විය හැකි බව ය.



ඉහත සඳහන් කළ හේතුව හෝ හේතු වෙන් වෙන් වශයෙන් ගෙන දීර\ඝ ලෙස සාකච්ජා කිරීමට මෙහි දී බලාපොරොත්තු නො වන අතර ඒ පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් පමණක් මෙහි දැක්වේ. රජරට ප්‍රදේශයේ ජලයේ ෆ්ලෝරයිඩ් අයන සාන්ද්‍රණය අධික බවට වූ අදහස සැලකීමේ දී 1991 වසරෙ\ දී පේරාදෙණි සරසවියේ භූ විද්‍යා අංශයේ මහාචාර\ය සී. බී. දිසානායක සිදු කළ සොයාබැලීම වැදගත් කොට දැක්විය හැකි ය. ඒ මඟතාට අනුව ලංකාවේ වර\ෂාපතනය වැඩි කලාපයට සාපේක්ෂව රටේ අනෙකුත් ප්‍රදේශවල භූගත ජලයේ ෆ්ලෝරයිඩ් සාන්ද්‍රණය ඉහළ ය. (සිතියම 1 බලන්න). එසේ වුවත් පැහැදිලි ව පෙනෙන කරුණක් නම් එසේ ෆ්ලෝරයිඩ සාන්ද්‍රණය අධික වන්නේ රජරට ප්‍රදේශයේ පමණක් නො වන බවයි. රටේ නැගෙනහිර සහ දකුණු ප්‍රදේශවල (රුහුණු රට) භූගත ජලයේ ද එවැනි ම අධික ෆ්ලෝරයිඩ සහ දකුණු ප්‍රදේශවල (රුහුණු රට) භූගත ජලයේ ද එවැනි ම අධික ෆ්ලෝරයිඩ සාන්ද්‍රණයක් ඇත. එසේ වුවත් රජරට වකුගඩු රෝගය නමින් හඳුන්වන රෝග තත්ත්වය එම ප්‍රදේශවල ඒ අයුරින් දක්නට නොමැත. ඊටත් වඩා මේ වකුගඩු රෝගය රජරට ප්‍රදේශය තුළ එක හා සමාන ව්‍යාප්තියක් නො දක්වයි. විශේෂයෙන් රජරට ද එක් සුවිශේෂී භූමිභාගයක වෙසෙන ජනතාව පමණක් ප්‍රබල ලෙස මේ රෝග තත්ත්වයට ගොදුරු වී ඇති බව ඉදිරියේ දී දැක්වෙන කරුණුවලින් පැහැදිලි වනු ඇත. මේ සිතියමේ රටේ උතුරු ප්‍රදේශයේ භූගත ජලයේ ෆ්ලෝරයිඩ සාන්ද්‍රණය ඉහළ ස්ථාන සටහන් නො වන්නේ ප්‍රදේශයේ පැවැති තත්ත්වය හේතුවෙන් පරීක්ෂණ කටයුතු සිදු කිරීමට අපහසු වූ බැවින් විය හැකි ය.

ඉදිරිපත් ව ඇති සෙසු අදහස් පිළිබඳව පැවසිය යුත්තේ කෘෂි රසායන භාවිතය, තත්ත්වයෙන් බාල ඇලුමිනියම් භාවිතය රජරටට පමණක් සීමා වී ඇති දෙයක් නො වන බවයි. මිනිසුන් දහස් ගණනක ගේ වකුගඩු නරක් කිරීමට තරම් ප්‍රබල ලෙස මේ රසායන ද්‍රව්‍ය සිරුරට ඇතුළු වේ නම් රටේ සෙසු ප්‍රදේශවලට සාපේක්ෂව ඉතා ඉහළ ලෙස රජරට මිනිසුන් මෙවා භාවිත කළ යුතු ය. ඇඹිලිපිටියේ හෝ ලුණුගම්වෙහෙරෙ\ මිනිසුන්ට

නැති ප්‍රශ්නයක් රජරට මිනිසුන්ට පමණක් ඇත්තේ ඇයි ද යන්න සංගත ලෙස පැහැදිලි කිරීමට මේ කවර හෝ අදහසක් සමත් යැයි අපේක්ෂා කළ නොහැකි ය.

වඩා වැදගත් වන්නේ "රජරට වකුගඩු රෝගය" ලෙස හැඳින්වුව ද රජරට යනුවෙන් හැඟවෙන භූමි ප්‍රදේශයේ සමජාතීය ව්‍යාප්තියක් හඳුනාගත නොහැකි වීම ය. මේ පිළිබඳව වැඩිදුර අවධානය යොමු කිරීමේ දී ඉතා වැදගත් නිරීක්ෂණයක් සිදු කිරීමට අපට හැකි විය. දඹුල්ල, කැකිරාව, අනුරාධපුර නගරය වැනි ප්‍රදේශවල ඉඳහිට රෝගියකු දෙදෙනකු වාර\තා වුව ද අති බහුතර රෝගීන් පිරිස හමු වන්නේ මහවිලච්චිය, තන්තිරිමලේ, මැදවච්චිය, කැබිතිගොල්ලෑව, පදවිය, ශ්‍රී පුර, මැදිරිගිරිය, වැලිකන්ද, අරලගංවිල, ගිරාඳුරුකෝට්ටේ වැනි ප්‍රදේශවලින් ය. විශේෂයෙන් මැදවච්චිය, පදවි ශ්‍රීපුර, ගිරාඳුරුකෝට්ටේ වැනි ප්‍රදේශවල වකුගඩු රෝගය වසංගතයක් බවට පත් වෙමින් ඇත. විටෙක එක ම පවුලේ කිහිප දෙනකු මේ රෝගයෙන් මිය ගොස් ඇත. තවත් විටෙක තරුණ විය නො ඉක්මවූවෝ ද වකුගඩු නරක් වී අසාධ්‍ය තත්ත්වයෙන් මරණය හා පොරබදිමින් සිටිති. එනම් මේ ප්‍රදේශ ක්‍රමයෙන් ජීවත් වීමට අපහසු ප්‍රදේශ බවට පත් වෙමින් ඇත. සුදුසු පිළියමක් සොයාගත නොහැකි වුව හොත් වෙනත් ප්‍රශ්න කෙසේ වෙතත් වකුගඩු රෝගය නිසා තවත් දශක දෙකකින් හෝ තුනකින් හෝ මේ ප්‍රදේශ ජනශූන්‍ය වනු ඇත.

රෝගය ප්‍රබල ලෙස ව්‍යාප්ත ව ඇති ප්‍රදේශ සැලකීමේ දී පෙනී යන වැදගත් කරුණ නම් මේ සියලු ප්‍රදේශ සුවිශේෂී ප්‍රදේශයකට යාබද ව පිහිටා ඇති බවයි. ඒ ප්‍රදේශය අන් කවරක් වත් නො ව දෙමළ නිජබිම යනුවෙන් දෙමළ ජාතිවාදීන් හඳුන්වන ප්‍රදේශයයි. (සිතියම 2). දෙමළ ජනතාව ගේ පාරම්පරික නිජබිම් යනුවෙන් හඳුන්වමින්, ඉංග්‍රිසින් නිර\මාණය කළ රටේ උතුරු හා නැගෙනහිර පළාත්, "ඊළම" ලෙස ලබාගැනීමට පිඹුරුපත් සැකසුණේ අද ඊයේ නො ව වසර දෙ සියයකටත් එපිට දී ය. එම කාලය පුරාවට ම තම ව්‍යාජ ඉතිහාසය සනාථ කිරීමටත්, මේ භූමිභාගය තමන් නතු කර ගැනීමටත් දෙමළ ජාතිවාදය නො කළ දෙයක් නැත. වසර විස්සකටත් වැඩි කලක් කොටි ත්‍රස්තවාදය ලෙස දියත් වූයේ ද එම ජාතිවාදී ව්‍යාප්තියේ ම එක් අංගයකි. ඔවුනට තමන් ගේ අභිලාෂය ඉෂ්ට කරගැනීමට තිබූ ප්‍රධාන ම බාධකයක් නම් මේ ඊනියා දෙමළ නිජබිම තුළ හා ඒ ආසන්නයේ විසූ සිංහල හා මුස්ලිම් ජනතාව ය. මුළු යාපනය අර\ධද්වීපය ම ඉතා කෙටි කලක් ඇතුළත වාර\ගික ශුද්ධ කිරීමකට ලක් විය. නැගෙනහිර පළාතේ සිංහල ගම්මානවලට සහ උතුරු හා නැගෙනහිර පළාත්වලට යාබද ව පිහිටි සිංහල ගම්මානවලට කඩා වැදුණු ම්ලේච්ඡ ත්‍රස්තවාදීහු සිය දහස් ගණනක් අහිංසක ගම්වැසියන් අමුඅමුවේ ඝාතනය කළ හ. මේ සියලු අභියෝග හමුවේ මේ අභීත මිනිස්සු තම උරුමය රැකගනිමින් කොටි ත්‍රස්තවාදයට මුහුණ දුන් හ.

එහෙත් අද මේ ගොවි ගම්මානවල දක්නට ලැබෙන තත්ත්වය අතිශයින් ශෝචනීය ය. කොටි ත්‍රස්තවාදියට පරාජය කළ නොහැකි වූ මිනිස්සු වකුගඩු රෝගය හමුවේ පසුබසිමින් සිටිති. වකුගඩු රෝගය ඇත්තේ කොහේ ද නැත්තේ කොහේ ද යන්න සොයාගැනීමට දැවැන්ත පර\යේෂණ, ව්‍යාපෘති, අවශ්‍ය නැත. දින කිහිපයක් විමසිලිමත් ලෙස මේ ප්‍රදේශවල සංචාරය කිරීම පමණක් ම ඒ සඳහා ප්‍රමාණවත් ය.

ඊනියා දෙමළ නිජබිමට යාබද ව පිහිටි සිංහල ජනතාව බහුල ලෙස වෙසෙන ප්‍රදේශවලින් බැහැර ද වකුගඩු රෝගය ලෙස අද අප හඳුන්වන රෝගී තත්ත්වය දක්නට ලැබෙන බව යමකුට පැවසිය හැකි ය. එය එසේ විය හැකි වුවත් එක් නිරීකෂණයක් නිරවුල් ලෙස ඉදිරිපත් කළ හැකි ය. එනම් "රජරට වකුගඩු රෝගය යැයි හඳුන්වන තත්ත්වය මේ රටේ ඊනියා දෙමළ නිජබිමට යාබද සිංහල ජනතාව බහුතර ලෙස වෙසෙන ප්‍රදේශවල කැපී පෙනෙන ලෙස ඉහළ" බවයි.

එසේ වුවත් මේ රෝගී තත්ත්වය දෙමළ ජාතිවාදයේ අනුග්‍රහය මත ඇති කරන ලද්දක් යැයි දැන්ම ම අපට පැවසිය නොහැකි ය. එහෙත් එවැනි හැකියාවක් අපට ලෙහෙසියෙන් බැහැර කළ නොහැකි ය. ලෝකයේ වෙනත් ප්‍රදේශ සැලකුව ද මේ ආකාරයට වසංගතයක් ලෙස වකුගඩු රෝගය පැතිර ගිය අවස්ථා සුලබ නැත. එවැනි එක් ප්‍රකට ස්ථානයක් නම් නැගෙනහිර යුරෝපයේ ඩැනියුබ් ගංගාව අවට ග්‍රාමීය ප්‍රදේශයයි. පැරණි යුගෝස්ලෝවියාවට අයත් ව තිබූ බොස්නියාව, ක්‍රොයේෂියාව, සර\බියාව වැනි රටවල් කිහිපයක ග්‍රාමීය ප්‍රදේශවලට මේ තත්ත්වය සීමා වී ඇත. ලංකාවේ දී මෙන් ම රෝග තත්ත්වය ඇති වන්නේ ඇයි ද යන්න පැහැදිලි කිරීමට අදහස් කිහිපයක් ම ඒ රටවල දී ද ඉදිරිපත් ව ඇති නමුත් ඒ එකක් පිළිබඳ හෝ පූර\ණ එකගතාවකට එළැඹීමට ඒ රටවල විද්වතුන්ට හැකි වී නැත. මෙම බෝල්කන් කලාපය ද දැඩි ලෙස බටහිර මැදිහත් වීම් සිදු වන බෙදුම්වාදී ව්‍යාපාර දියත් වන ප්‍රදේශයකි.

මේ සමග ම අප ගේ අවධානය යොමු විය යුතු තවත් වැදගත් කරුණක් ඇත. මෙම රෝග තත්ත්වය සංගත ලෙස පැහැදිලි කිරීමට මේ වන තෙක් බටහිර දැනුම පද්ධතියට හැකියාවක් ලැබී නැත. එසේ වූ පමණින් බටහිර විද්‍යාව හෝ බටහිර වෛද්‍ය විද්‍යාව අවිද්‍යාත්මක යැයි අපි කවරෙක් හෝ නො කියමු. එහෙත් ජ්‍යොතිෂ්‍යයට හෝ වෙනත් බටහිර නො වන දැනුම් පද්ධතියකට යම් නිරීකෂණයක්, සිද්ධියක් සංගත ව පැහැදිලි කිරීමට නොහැකි වුව හොත්, නිවැරැදි අනාවැකියක් පැවසීමට නොහැකි වුව හොත් ඇති වන තත්ත්වය අමුතුවෙන් විස්තර කළ යුතු නො වේ.

එසේ ම මනුෂ්‍ය වර\ගයා එක් චින්තනයක්, එක් සංස්කෘතියක්, එක් දැනුම් පද්ධතියක් මත පමණක් යැපීමෙන් ඇති වන අවදානම වටහා ගැනීමට ද මෙය කදිම උදාහරණයකි.

යම් නිරීකෂණයක්, සිද්ධියක් රෝගයක් පැහැදිලි කිරීමට හැකියාව ඇත්තේ බටහිර දැනුම් පද්ධතියට පමණකැයි අප නො සිතිය යුතු ය. ඒ සඳහා වෙනත් චින්තන ධාරාවක, වෙනත් සංස්කෘතියක ගොඩනැගුණු දැනුම් පද්ධතිවලට ද හැකියාව ඇත. අප ඒවා අවිද්‍යාත්මක යැයි බැහැර කළ යුතු නො වේ. විශේෂයෙන් ම ව්‍යාජ දෙමළ නිජබිමට යාබද ප්‍රදේශවල සිංහලයන් අතරෙ\ පැතිර යන වකුගඩු රෝගය (ඇතැම් විට වකුඩගු රෝගය ලෙස කරන හැඳින්වීම ද අනාගතයේ දී අපට වෙනස් කිරීමට සිදුවිය හැකි ය) උදෙසා සුදුසු පිළියමක් සිංහල බෞද්ධ චින්තනය තුළින්, සිංහල බෞද්ධ විද්‍යාවක් තුළින් නිර\මාණය කරගැනීමට මෙරට ජාතික බුද්ධිමතුන් යුහුසුලු විය යුතු ය. එහෙත් ඉන් අදහස් වන්නේ බටහිර විද්‍යාවට එවැනි හැකියාවක් නැතැයි යන්න හෝ ඒ උදෙසා බටහිර දැනුම් පද්ධතිය තුළ උත්සාහ නො දැරිය යුතු ය කියන හෝ නො වේ.

අද සතියේ විමසුම

රජරට වෛද්‍ය පීඨයේ

වෛද්‍ය චන්න සුදත් ජයසුමන

විදුසර සටහන (

මේ විශේෂාංගයෙහි දැක්වෙන කරුණු විවිධ පාර\ශ්වවලට විවිධ ආකාරයෙන් ග්‍රහණය විය හැකි ය. ප්‍රතිචාර ද විවිධ විය හැකි ය. එහෙත් මෙහි එන කරුණු අළලා දියත් කෙරෙන ඉදිරි ගවේෂණයන්හි දී ඒ ඕනෑ ම අදහසක ඉවත නො හළ හැකි වටිනාකමක් ගැබ් ව තිබිය හැකි ය.

හුදෙක් ම නිරීක්ෂණයන් පදනම් කරගෙන පෙළගස්වා ඇති මෙහි එන කරුණු, එපමණකට සීමා නො වී ඉන් ඔබ්බට ගිය පර\යේෂණ, සංවාද, සාකච්ඡාවලට බඳුන් වීම උචිත බව අප ගේ වැටහීමයි. (ලේඛකයා ගේ ද අදහස එවැන්නක් බව ඔහු සඳහන් කර ඇත.)

එබැවින් විදුසර තුළින් හාපුරා කියා එළි දැක්වෙන රජරට වකුගඩු උවදුර පිළිබඳ මේ පෙරළිකාර අර\ථකථනය සම්බන්ධයෙන් ක්‍රියාශීලී ලෙස විපරමක යෙදෙන මෙන් මේ සම්බන්ධයෙන් උනන්දු වන සියලු පාර\ශ්වයන් ගෙන් අපිදු ඉල්ලා සිටිමු. මෙහි එන අදහස් වැඩිදුර ගවේෂණයකට ලක් නො කර ම අවඥාවෙන් යුතුව ප්‍රතික්ෂේප කරන්නන්ට මෙන්ම හිස් මුදුනින් අනුමත කරන්නන්ට ද එක සේ මේ ඇරයුම වලංගු වේ.

විශේෂයෙන් ම අදාළ විශේෂඥයන් ගේ සහාය ද ඇති ව මේ අළලා පුළුල් ගවේෂණයක් දියත් කිරීම (මේ අදහස ප්‍රතික්ෂේප කිරීම සඳහා වුව) වඩාත් උචිත වනු ඇත. සම්බන්ධීකාරක පාර\ශ්වයක් ලෙස විදූසරට ද එම ව්‍යායාමයෙහි කොටස්කරුවකු විය හැකි බව සඳහන් කර සිටිමු. මෙහි එන කරුණු පිළිතුරු ලිපි මගින් සංවාදයකට බඳුන් කිරීමට කවරකු හෝ අදහස් කරන්නේ නම් ඒ ද සලකා බැලිය හැකි ය.